# ද්විත්ව බලයෙන් ඔබ්බට

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය කලකට පෙර කළ යුතුව තිබූ දෙයක් පසුගිය සඳුදා කළාය. ඇමැති ධුර තුනක් තමා වෙතට පවරාගත් ඇය බලය ඇත්තේ කාහට දැයි නිශ්චිතව ම පෙන්වා දී ඇත. ඇය ජනමාධ්‍ය ඇමැති ධුරය භාරගත් දිනට පසුදින සිට රූපවාහිනිය වෙනස් වී ඇත. ටයි කෝට් ප්‍රවෘත්ති ප්‍රකාශකයා වෙනුවට පැරැණි කපටි කිටට සමාන ඇඳුමක් අඳින ප්‍රවෘත්ති ප්‍රකාශකයා නැවත පැමිණ ඇත. රූපවාහිනිය නැවතත් ශ්‍රී ලං නි පක්ෂයේ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම අරඹා ඇත. දැන් එහි වික්‍රමබාහු නැත. වෙනත් දිනයක නම් වික්‍රමබාහු ජනාධිපතිනිය අමාත්‍යාංශ තුනක් තමා යටතට ගැනීම ගැන හා එමගින් ඊනියා සාම ව්‍යාපාරයක් කඩා කප්පල් කිරීම ගැන පඬිවදන් දෙසනු අපට දැකගත හැකිව තිබුණි. එහෙත් අද ඔහු නැත. ඔහු සිටියත් නැතත් ජනාධිපතිනියගේ ක්‍රියාවෙන් ඊනියා සාමයට වන හානිය පිළිබඳව මහදැනමුත්තන් මේ වන විට තළු මරමින් කියනු අපට දැකගත හැකිවන්නට තිබුණි. එහෙත් ඒ කිසිවක් මේ ලියන මොහොතෙහි දැක ගන්නට නැත. ඒ වෙනුවට පොදු පෙරමුණේ පුවත් පත් සාකච්ඡාවක් නම් විකාශය විය.

බලය මාරුවීම මෙතරම් සුමට ව සිදුවීමට ඉඩ ඇතැයි සිතිය නොහැකිය. සමහර විට මේ ලිපිය පළවන අවස්ථාව වනවිට තත්ත්වය නැවතත් වෙනස්වී ටයිකෝට් කරුවන් ප්‍රවෘත්ති කියවනු දැක ගැනීමෙහි ඉඩක් වෙයි. අද ජාතික හා විජාතික බලවේග අතර බලය උරගා බැලෙන අවස්ථාවක් එළඹී ඇත. ජාතික බලවේගවලට තවමත් ඉදිරි දැක්මක් ඇති නායකයෙක් නැත. එබැවින් දැනට සිටින ඊනියා නායක නායිකාවන් සමග සුදුසු පරිදි කටයුතු කිරීමට අපට සිදුවෙයි. ජාතික බලවේගවලට ඇති මේ නායකත්ව අඩුව නොවන්නට මේ වනවිට ඊනියා සටන් විරාම නායකයා පමණක් නොව නෝර්වේ තානාපති ද අගමැති ඇතුළු අනෙක් ඇමැතිවරු බොහෝ දෙනකු ද ගෙදර යැවීමට කටයුතු කිරීමට තිබුණි.

කෝට් සංවිධානය තම යෝජනා ඉදිරිපත් කිරීමට පෙරම රටේ ද්විත්ව බලයක් ගොඩ නැගෙමින් තිබුණි. ඊනියා සටන් විරාම කණ්ඩායමේ නායක ටෙලෙෆ්සන් ආපසු නෝර්වේ රටට ගෙන්වා ගන්නා ලෙස ජනාධිපතිනිය ඉල්ලා සිටියා ය. ආණ්ඩුව නමින් හැඳින්වෙන්නාවූ ද, විජාතික බලවේගවල මෙරට නිවට ගැත්තා වූද ආයතනය ටෙලෙෆ්සන් ගැන විශේෂ යමක් නොකියයි. ඔවුනගේ නිහඬ ප්‍රතිපත්තියෙන් කියැවෙන්නේ ජනාධිපතිනිය කර ඇති ප්‍රකාශයට ඔවුන් විරුද්ධ බවය. නෝර්වේ රාජ්‍යද මේ පිළිබඳව කිසිවක් නිල වශයෙන් නොකියයි. එහෙත් ඔවුන්ට අවශ්‍ය කුමක්ද යන්න පිළිබඳව අටුවා ටීකා අවශ්‍ය නැත. නෝර්වේ අගමැතිවරයාට එරට පළවන පුවත්පතක කියා තිබුණේ ලංකාවේ ජනාධිපතිනිය සාම ක්‍රියාමාර්ගයට බාධා පමුණුවන බවය. ටෙලෙෆ්සන් ගැන නැවත සිතා බැලීමට දැන් නෝර්වේ ආණ්ඩුවට සිදු වී ඇත.

ද්විත්ව බලය පිළිබඳ කරුණට අදාළ නොවෙතත් පසුගිය දිනවල සිදුවූ පොංගු තමිල් ගැන ද වචනයක් හෝ කිව යුතුය. හිරු කණ්ඩායම නමින් හැඳින්වෙන දෙමළ ජාතිවාදී කොටි අනුගාමික රාජ්‍ය නොවන නඩයක් ඊනියා සිංහල දමිළ කලා උළෙල නමින් පොංගු තමිලක් සංවිධානය කිරීමට කටයුතු කර තිබුණි. ඒ සඳහා ඔවුන්ට ලැබුණු ගාස්තුව කොපමණදැයි අපි නොදනිමු. රාජ්‍ය නොවන නඩවලට කොහොමටත් විදේශවලින් මුදල් ලැබෙයි. පොංගු තමිලක් කොළඹ පැවැත්වෙන බව ඇතැම් දෙමළ පක්ෂ ද කියා තිබුණි. දැන් හෙළි වී තිබෙන ආකාරයට එහිදී කතා කළ එක් කවිකයකු ප්‍රභාකරන්ගේ ඊනියා වීරත්වය ගැන ස්තෝත්‍ර ගයා ඇත. එහිදී නැගී සිටි අයකු (ඔහු සිහල උරුමයේ සාමාජිකයකු නොවන බව එදා ද බොහෝ දෙනා දැන සිටි නමුත් බකීර් මාකර්, ගංගනාත් ගයිරික ජනමාධ්‍ය සේවාව එය විකෘති කර ප්‍රචාරය කළේය.) මෙතැන පවත්වන්නේ සාහිත්‍ය උළෙලක් ද නැත්නම් ප්‍රභාකරන් වීරත්වයට පත්කිරීමක්ද යන අදහස ගෙන දෙන ප්‍රශ්නයක් අසා ඇත. භාෂණ නමින් හැඳින්වෙන්නාගේ ගෝලබාල පිරිස භීෂණයක් ඇති කර තිබෙන්නේ මේ අවස්ථාවේය. පොලු අතින්ගත් පිරිසක් අර ප්‍රශ්න විචාරකයාට ඉතා අමානුෂික ලෙස පහරදී ඇත. ඊනියා ප්‍රබුද්ධ කලාකරුවන් සාහිත්‍යධරයන් වූ සුචරිත ගම්ලත්, ධර්මසිරි බණ්ඩාරනායක, පරාක්‍රම නිරිඇල්ල, ජයතිලක කම්මැල්ලවීර, අශෝක හඳගම ආදීන් අර අහිංසකයාට පොලුවලින් පමණක් නොව පයින් ද සංග්‍රහ කරනු කිසිම විරුද්ධත්වයකින් තොරව බලා හිඳ ඇත. සිංහලයන්ට මේ රටේ ප්‍රශ්නයක් ඇසීමටවත් අයිතියක් නැතැයි මේ කසිකබල් ප්‍රබුද්ධයන් සිතන්නට ඇත. මේ ආරම්භක පහරදීම් අවස්ථාව වන විට සිහල උරුම

© Prof. Nalin De Silva

සාමාජිකයන් පිකට්ටුවක් සඳහා ශාලාවෙන් පිටත කටයුතු කරමින් සිට ඇත. සුචරිත ගම්ලත් ද කතාවක් කරමින් දෙමළ ජාතියේ අයිතිවාසිකම් වෙනුවෙන් තම ජීවිතය වුවත් පූජා කිරීමට තමන් කැප වී සිටින බවක් කියා ඇත.

එහෙත් ඔහු දෙමළ ජනයාට දෙමළ වීම නිසාම ඇති ප්‍රශ්නය කුමක්දැයි නොකියයි. එමෙන්ම ඔහු තමන් පූජා කරන්නට බලාපොරොත්තු වන්නේ තමන් ගතකරන ජීවිතවලින් කිනම් එක ද යන්න සඳහන් නොකරයි. භාෂණගේ භීෂණ කණ්ඩායම ප්‍රශ්න විචාරකයාට පහර දුන් නමුත් මේ ඊනියා ප්‍රබුද්ධයන් කිසි විටෙකත් ඒ ගැන සඳහන් නොකළ බව වාර්තා වෙයි. ඒ වෙනුවට ඔවුන් සිහල උරුමයට හා දවයින පුවත්පතට පහර ගසා ඇත. පොලු ආදියෙන් පමණක් නොව වෙනත් ආයුධවලින් ද මේ භාෂණ භීෂණ කණ්ඩායම සමන්විත වූ බව එයට සහභාගි වූවෝ කියති. ජනමාධ්‍ය මාෆියාව මේ ඊනියා ප්‍රබුද්ධයන්ගේ ප්‍රකාශවලට වැදගත් තැනක් දීමට කටයුතු කර ඇත. නිකම්ම නිකම් පුස්සන් පිරිසකට ප්‍රබුද්ධයන් යන නම ප්‍රදානය කරමින් මේ රටේ ගෙන යන ප්‍රබුද්ධ ව්‍යාපෘතියේ සෙළුව මේ සිද්ධියෙන් මනාව පෙනී යෑමට සැලැස්වීම පිළිබඳව නම් කිසිම දෙයක් ගැන තරමක් හෝ ගැඹුරින් නොදත් භාෂණට හා ඔහුගේ භීෂකයන්ට ස්තුති කළ යුතුය. මේ කසිකබල් ප්‍රබුද්ධයන්ගෙන් බොහෝ දනො එක්කෝ තවමත් කිසිම කසිකබල් මාක්ස්වාදීහු වෙති. නැත්නම් හිටපු මාක්ස්වාදීහු වෙති. මාක්ස්වාදය යනු බංකොලොත් අසංගත දැනුම් පද්ධතියකි. එහෙත් මේ කසිකබල් ප්‍රබුද්ධයන්ගෙන් බොහෝ දෙනකු සිතාගෙන ඇත්තේ මාක්සාවදය ඊනියා විද්‍යාත්මක කියාය. ඊනියා විද්‍යාවද මහා මසිරියක් නොවේ. එය ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය තුළ නිර්මාණය කෙරුණු කතන්දර කිහිපයක් පමණකි. ඒ සංස්කෘතිය තුළ ම බිහිවුණු මාක්ස්වාදයේ අඩුම තරමින් සංගත බවක්වත් නැත. අටවැනි පංතියෙන් පසුව බටහිර විද්‍යාව හදාරා නැති මේ කසිකබල් ප්‍රබුද්ධයන්ගෙන් බොහෝ දෙනකුට (යමකුට හැකියාවක් ඇත්නම් පොතපත කියවා බටහිර විද්‍යාව තනියම වුවද ඉගෙන ගත හැකිය. එහෙත් මොවුන්ට ඒ හැකියාව නැත. තමන් ලියන පත්තර පඩංගුවල පල් හැලි නොකියා ඉදිරිපත් වන්නේ නම් ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක දී ඒ හැකියාව මොවුන්ට නැති බව පෙන්වා දිය හැකිය.) බටහිර විද්‍යාව යනු ඊනියා වාස්තවික සත්‍යය හෝ ඊනියා වාස්තවික සත්‍යය සොයා යන්නකි. එහෙත් එය තවත් කතන්දර කිහිපයක් පමණකි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයේ ඒජංතයන් වූ මේ කසිකබල් ප්‍රබුද්ධයනට අවශ්‍ය නම් හා හැකිනම් මා විසින් ලියන ලද විද්‍යා කතන්දර නමැති පොත එළි දැක්වීම අරභයා මෙම මස විසිපස්වැනිදා විද්‍යා මන්දිරයේදී පැවැත්වෙන දේශනයෙන් පසුව ඒ කරුණ සම්බන්ධයෙන් මා අභියෝගයට ලක් කළ හැකිය.

කසිකබල් ප්‍රබුද්ධයන් ගැන ලීවේ පසුගිය දිනවල මාධ්‍ය මාෆියාවෙන් පොංගු තම්ලය ප්‍රවෘත්තිය විකෘති කළ නිසා මිස ද්විත්ව බලය පිළිබඳ කරුණෙහි දී ඔවුන් වැදගත්වන නිසා නොවේ. එහි දී වැදගත් වූ කරුණක් නම් අගවිනිසුරුවරයාට එරෙහිව ඉදිරිපත් කරන ලද දෝෂාභියෝගයයි. අගවිනිසුරුවරයා ඒ තනතුරින් ඉවත්කිරීමට බොහෝ දෙමළ ජාතිවාදීන්ට පසුගිය කාලයේ අවශ්‍ය වූ බව රහසක් නොවේ. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික මෙන්ම ආර්ථික හා දේශපාලන යටත්විජිතවාදයෙහි ද සෘජු නියෝජිතයෝ මෙහි දී ඉදිරියෙන් ම සිටියහ. දෙමළ ජාතිවාදය සැනසීම සඳහා ඔවුන් පිටුපස එදත් අදත් සිටින බටහිරයන්ගේ අවශ්‍යතාවය පරිදි ඊළමක් බිහිකර සිංහලත්වයට පහර ගැසීම මේ නියෝජිතයන්ගේ ප්‍රධාන අරමුණ වෙයි. කොටි ත්‍රස්තවාදීන් විසින් පසුගියදා ඉදිරිපත් කරන ලද යෝජනාවල මූලික අවශ්‍යතාවය වනුයේ සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීමය. රනිල් වික්‍රමසිංහ මහතා කලක සිමට කියන අසමජ්ජාති අසම්මතික බලය බෙදීම යනු සන්ධීය හෙවත් ෆෙඩරල් ඉක්මවන සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීම මිස අනෙකක් නොවේ. සහසන්ධීය රාජ්‍යය ඊළමෙහි එළිපත්තේ වෙයි. කොටි යෝජනා එකින් එක ගෙන විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාවයක් නැත. අප දැන් කාලයක් තිස්සේ කියන අයුරින් දෙමළ ජාතිවාදය උත්සාහ කරන්නේ ඊළම භුක්තියට සවිකර ගැනීමට ය. එය ව්‍යවස්ථාවට එකගව තුනෙන් දෙකේ වැඩි ඡන්දයකින් කරගත නොහැකි බව ඔවුහු දනිති. එසේ වුවත් භුක්තියට සවිකර ගැනීමේදී ද යම් යම් නීතිමය ගැටළු මතුවෙයි. ඒ නිරාකරණය කර ගත හැක්කේ ශ්‍රේෂ්ඨාධිකරණයෙනි. අනෙක් අතට ජනාධිපතිනියගේ බලතල ද දෙමළ ජාතිවාදීන්ට ප්‍රශ්නයක් වෙයි. ඒ බලතල ද සීමා කරන අධිකරණ තීන්දු ඔවුන්ට අවශ්‍ය වෙයි. තම්ල්සෙල්වන් නම් ත්‍රස්තවාදියා කොටි යෝජනා ඉදිරිපත් කරමින් ආණ්ඩුව ව්‍යවස්ථාවෙන් ඔබ්බට යා යුතු යැයි කීවේ නිකමට නොවේ. ඒ සියල්ලහි දී සරත් සිල්වා මහතා අපක්ෂපාතී වීම දෙමළ ජාතිවාදීන්ට ගැටළුවකි. මේ බව තේරුම්ගත් ඇතැම් දෙමළ ජාතිවාදීහු කල්තබාම ඒ මහතා තනතුරින් ඉවත් කිරීමේ වැයමක යෙදුණහ. කෙටියෙන් කිවහොත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දේශපාලන තීන්දු ලබා ගැනීම ඔවුන්ගේ අරමුණ විය.

© Prof. Nalin De Silva

ජනාධිපතිනිය ආරක්ෂක කටයුතු අමාත්‍යාංශයේ කරුණක් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස් දැනගැනීමට තැත් කළ විට ප්‍රශ්නය තවත් කල් තැබීමට බටහිරයන්ට හා ඔවුන් ගේ සියලුම රාජ්‍ය නොවන නඩවලට නොහැකි විය. ඊනියා ආණ්ඩුවද තවත් රාජ්‍ය නොවන නඩයක් පමණකි. දෝෂාභියෝගය එහි ප්‍රතිඵලය විය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට ක්‍රියාත්මක වීමට තවත් බලා සිටීමට නොහැකි විය. අඩුම තරමින් ඇගේ පැවැත්ම සඳහා තීරණයක් ගත යුතු විය. ඇමැතිවරු තිදෙනෙකුගේ ඇතැම් අමාත්‍යාංශ ඉවත් කෙරුණේ එහි ප්‍රතිඵලයක් ලෙසය. පාර්ලිමේන්තු සැසිවාරය කල්තැබීමෙන් දේෂාභියෝගය ද යට ගියේය. අද ද්විත්ව බලය පිළිබඳ ප්‍රශ්නය දේශපාලනයේ ඉහළටම එස වී ඇත. අද ජාතික බලවේග හා විජාතික බලවේග අතර සටන ඉතා උග්‍ර වී ඇත. සියල්ල තීරණය කෙරෙන්නේ මේ සටන මතය. අද ජනාධිපතිනියට නෝර්වේ පමණක් නොව ඔවුන් පිටුපස සිටින බ්‍රිතානිය හා ඇමරිකාව ද විරුද්ධ වෙයි. මේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන් පසුබා යාවි යැයි මොහොතකටවත් සිතිය යුතු නොවේ. ඔවුන්ට කළ හැකි සෑම දෙයක්ම ඔවුන් කරනු ඇත. මෙහි සෑම යනු සෑම බව අවධාරණය කළ යුතුය. මිනී මැරුම් මිනිසුන් මුදලට ගැනීම් ආදී දහසකුත් එකක් දේ ඔවුන්ගේ මෙවලම් මල්ලේ ඇත. ජාතිකවාදී බලවේග මේ කරුණු හොඳින් අධ්‍යයනය කළ යුතුය. කිසිවක් කිරීමට අපොහොසත් වුවහොත් බටහිරයන් අඩුම තරමින් නැවතත් කුමාරතුංග මහත්මිය යොදා ගැනීමට හෝ උත්සාහ කරනු ඇත. බොහෝ විට බටහිරයන් මේ විකල්පයට තල්ලු වීමට ඉඩ ඇත්තේ අද බල තුලනය ජාතික බලවේගවලට යම් ජයග්‍රහණයක් අත් කර දී ඇති බැවිනි. බටහිරයෝ කපටියෝ වෙති. ව්‍යවස්ථාවට පිටින් යන බවක් ඇඟවීමට ඔවුහු අකමැති වෙති. එත්සත් ජාතික පෙරමුණට නීතිය අනුව කටයුතු කිරීමට උපදෙස් ලැබෙන්නේ ඒ නිසා විය හැකිය.

අද රට තීරණාත්මකම අවස්ථාවෙහි පසුවෙයි. දෙමළ ජාතිවාදයත් එහි සියලු ආධාරකරුවනුත් එයපිටුපස සිටින බටහිරයනුත් පරාජය කළ හැකිය. මේ අවස්ථාවේ ඉන්දියාව යම් තීරණයක් ගනු ඇත. එහෙත් ඒ මතම රැඳීමට ජාතික බලවේගවලට නොහැකිය. තමන්ගේ ම ශක්තිය මත නැගී සිටීමට ජාතික බලවේගවලට සිදුවනු ඇත. සමහර විට බටහිරයන් ඉන්දියාව ද කුමාරතුංග මහත්මියද එකග කරගෙන දෙමළ ජාතිවාදයට මේ අවස්ථාවේදී දිය හැකි උපරිම සහනය ලබා දීමට කටයුතු කරනු ඇත්තේ මතු දිනයක එයට වඩා වැඩි දෙයක් ලබා දීමේ බලාපොරොත්තුවෙනි. ජාතික බලවේග ඉදිරියටම යා යුතුය. කුමාරතුංග මහත්මිය බටහිර ග්‍රහණයට ගැනීමෙන් වළක්වාලීම සඳහා කළ හැකි දෑ කවරේ දැයි සිතා ඒ අනුව කටයුතු කිරීම ජාතික බලවේගවල අරමුණ විය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva